ආයතනයේ නම : ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුව

පාර්ලිමේන්තු ප්‍රකාශනමාලා අංක : **491**

පාර්ලිමේන්තුවේ රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව විසින් සභාගත කරන ලද ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුවට සම්බන්ධ වාර්තාව සම්බන්ධයෙන් ස්ථාවර නියෝග අංක 119(4) යටතේ ගරු මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යවරයාගේ නිරීක්ෂණ සහ ගනු ලබන පියවර පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කිරීම

நிறுவனத்தின் பெயர் : இலங்கை புகையிரதத் திணைக்களம்

பாராளுமன்ற வெளியீட்டுத் தொடர் இலக்கம் : 491

பாராளுமன்ற பொது கணக்கு குழுவால் பாராளுமன்றத்திற்கு சமர்ப்பிக்கப்பட்ட இலங்கை புகையிரதத் திணைக்களம் தொடர்பான அறிக்கை தொடர்பாக கௌரவ நிதிஇ திட்டமிடல் மற்றும் பொருளாதார அபிவிருத்தி அமைச்சர் அவர்களால் நிலையியல் கட்டளை இலக்கம் 119(4)-இன் கீழ் எடுக்கப்பட்ட அவதானிப்புகள் மற்றும் நடவடிக்கைகள் சமர்ப்பிப்பு

Name of the Institution : Sri Lanka Railways

Parliamentary Series : 491

Submission of the observations and measures taken by Hon. Minister of Finance, Planning and Economic Development under Standing Order No. 119(4) regarding the report on the Sri Lanka Railways tabled by the Committee on Public Accounts of Parliament, to the Parliament

මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය
நிதி, திட்டமிடல் மற்றும் பொருளாதார அபிவிருத்தி அமைச்சு
MINISTRY OF FINANCE, PLANNING AND ECONOMIC DEVELOPMENT

මහලේකම් කාර්යාලය, කොළඹ 01, ශ්‍රී ලංකාව. | செயலகம், கொழும்பு 01. இலங்கை. | The Secretariat, Colombo 01. Sri Lanka.

කාර්යාලය / அலுவலகம் / Office: 011 - 2484500, 011 - 2484600, 011 - 2484700
ෆැක්ස් / தொலைநகல் / Fax: 011 - 2449823
වෙබ් අඩවිය / இணையத்தளம் / Website: www.treasury.gov.lk

මගේ අංකය / எனது இல. / My No.: MF06/10//PS/491
ඔබේ අංකය / உமது இல. / Your No.:
දිනය / திகதி / Date: 2026.05.25

ගරු පාර්ලිමේන්තුවේ සභානායකතුමා මගින්
ගරු පාර්ලිමේන්තුවේ කථානායකතුමා
ශ්‍රී ලංකා පාර්ලිමේන්තුව
ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ

<u>අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු, පළාත් සභා සහ පළාත් පාලන ආයතනවලට අදාළව රාජ්‍ය ගිණුම් කාරක සභාව විසින් පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන ලද වාර්තාව සම්බන්ධයෙන් මුදල් විෂය භාර අමාත්‍යවරයාගේ නිරීක්ෂණ සහ ගනු ලැබූ පියවර ඉදිරිපත් කිරීම.</u>
<u>පාර්ලිමේන්තු ප්‍රකාශනමාලා අංක 491 රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාවේ වාර්තාව - ශ්‍රී ලකා දුම්රිය දෙපාර්තමේන්තුව.</u>

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුවේ නව සංශෝධිත පාර්ලිමේන්තු ස්ථාවර නියෝග අංක 119(4) අනුව රජයේ ගිණුම් කාරක සභාව විසින් අමාත්‍යාංශ සහ දෙපාර්තමේන්තුවල කටයුතු විමර්ශනය කිරීමෙන් අනතුරුව එම කමිටුව විසින් පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලබන වාර්තාවේ සඳහන් නිරීක්ෂණ/නිර්දේශ/නියෝග සම්බන්ධයෙන් මුදල් විෂය භාර අමාත්‍යවරයා විසින් සිය නිරීක්ෂණ සහ ගන්නා ලද පියවර, පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරනු ලැබිය යුතුය.

ඒ අනුව, දසවැනි පාර්ලිමේන්තුවේ පළමුවැනි සභා වාරය තුල දී රාජ්‍ය ගිණුම් කාරක සභාව විසින් විමර්ශනයට ලක් කරන ලද, ශ්‍රී ලකා දුම්රිය දෙපාර්තමේන්තුව පිළිබඳ විමර්ශනය පදනම් කරගෙන රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව විසින් සම්පාදිත වාර්තාව පාර්ලිමේන්තු ප්‍රකාශනමාලා 491 හි අන්තර්ගත වේ. ඒ සම්බන්ධයෙන් ගරු මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යවරයා වශයෙන් මාගේ නිරීක්ෂණ සහ ගනු ලබන පියවර පිළිබඳ වාර්තාව මේ සමඟ ඉදිරිපත් කරමි.

රාජ්‍ය ගිණුම් කාරක සභාවේ නිර්දේශ සම්බන්ධයෙන් ශ්‍රී ලකා දුම්රිය දෙපාර්තමේන්තුව විසින් ප්‍රගතිය වාර්තා කර ඇති අතර මේ සම්බන්ධ ඍජු වගකීම ප්‍රවාහන, මහාමාර්ග සහ නාගරික සංවර්ධන අමාත්‍යාංශය සතු වන අතර වාර්තාවේ ඇතුලත් කරුණු සම්බන්ධයෙන් මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යාංශයේ විෂය පථයට අදාලවන කරුණු පිළිබඳ නිරීක්ෂණ සහ ගන්නා ලද පියවර මෙම වාර්තාවේ ඇතුලත් කර ඇති බව ගරු පාර්ලිමේන්තුවේ අවධානයට යොමු කරමි.

අනුර කුමාර දිසානායක
මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍ය

පාර්ලිමේන්තු ප්‍රකාශන මාලා අංක : 491

ආයතනයේ නම : ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුව

පාර්ලිමේන්තුවේ රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව විසින් සභාගත කරන ලද ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුවට සම්බන්ධ වාර්තාව සම්බන්ධයෙන් ස්ථාවර නියෝග අංක 119(4) යටතේ ගරු මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යවරයාගේ නිරීක්ෂණ සහ ගනු ලබන පියවර පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කිරීම

අංකය	කාරක සභාවේ නිර්දේශ	නිර්දේශ ක්‍රියාත්මක කිරීමට ආයතනය විසින් ගනු ලැබූ ක්‍රියාමාර්ග/ වර්තමාන තත්ත්වය
01	**විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම් පැවැත්වීම.**	කළමනාකරණ විගණන දෙපාර්තමේන්තුව විසින් නිකුත් කරන ලද DMA/01/2019 හා ඊට පසු නිකුත් කළ DMA/1/2025 චක්‍රලේඛ ප්‍රකාරව අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු, දිස්ත්‍රික් ලේකම් කාර්යාල හා විශේෂ වියදම් ඒකක විසින් කාර්තුවකට එක් රැස්වීමක් වන අයුරින් අවම වශයෙන් ප්‍රවර්ථන වර්ෂයට අදාළව විගණන හා කළමනාකරණ කමිටු රුැස්වීම් 04 ක් වත් පැවැත්වීමේ වගකීම ප්‍රධාන ගණන් දීමේ නිලධාරි/ ගණන් දීමේ නිලධාරි වෙත පැවරේ. මෙහි දී, අදාළ කමිටුව වෙත නියෝජිතයකු සහභාගී කරවීම පමණක් කළමනාකරණ විගණන දෙපාර්තමේන්තුව විසින් සිදු කරනු ලැබේ. ඒ අනුව, දුම්රිය දෙපාර්තමේන්තුව විසින් විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම් නියමිත පරිදි නොපැවැත්වීම සම්බන්ධයෙන් වන නිරීක්ෂණයට අදාළ ව විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම් පැවැත්වීමේ මූලික වගකීම, එකී දෙපාර්තමේන්තු සතුවන අතර කළමනාකරණ විගණන දෙපාර්තමේන්තුව විසින් එකී රැස්වීම් සඳහා දෙපාර්තමේන්තුව නියෝජනය කරමින් නිලධාරීන් සහභාගී කරවීම හා අභ්‍යන්තර පාලන පද්ධති වැඩිදියුණු කිරීමට අවශ්‍ය මග පෙන්වීම් ලබාදීම සිදු කරනු ලබන බව කාරුණිකව දන්වා සිටිමි.
02	**වාර්ෂික වාර්තා ප්‍රමාදව පාර්ලිමේන්තුවේ සභාගත කිරීම** <u>කාරක සභාවේ නිර්දේශ</u> • ඉදිරියේදී ප්‍රමාදයකින් තොරව වාර්ෂික වාර්තා ඉදිරිපත් කිරීමට කටයුතු කරන ලෙස කාරක සභාව	වාර්ෂික කාර්යසාධන වාර්තා පිළියෙළ කිරීම සහ පාර්ලිමේන්තුවේ සභාගත කිරීම සම්බන්ධයෙන් අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු, පළාත් සභා සහ පළාත් පාලන ආයතනවලට මග පෙන්වීම සඳහා 2020.08.28 දිනැති රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක 02/2020 හි 12 ඡේදයෙහි විධිවිධාන සහ එම වාර්තා සකස් කිරීම සඳහා භාවිතා කළයුතු ආකෘති පත්‍ර

	දෙපාර්තමේන්තුවේ ග.නි. වෙත නිර්දේශ කරන ලදි. • මෙම කාල සීමාවේ සේවයේ නියුතුව සිටි හිටපු දුම්රිය සාමාන්‍යාධිකාරීවරුන් සහ අමාත්‍යාංශ ලේකම්වරුන් මීළඟ රැස්වීමට කැඳවා ප්‍රමාදයන්ට හේතු විමසීමට කාරක සභාව තීරණය කළ අතර අවශ්‍ය තොරතුරු ලබා ගෙන එකී නිලධාරීන් කාරක සභාව හමුවට කැඳවන ලෙස කාරක සභාවේ ලේකම් වෙත කාරක සභාව නිර්දේශ කරන ලදි.	සම්බන්ධයෙන් මාර්ගෝපදේශ අංක 14 නිකුත් කර ඇත. 2021 වර්ෂයේ රට තුළ පැතිර ගිය Covid -19 ගෝලීය වසංගත තත්ත්වය හේතුවෙන් රාජ්‍ය ආයතනවල දෛනික රාජකාරී සඳහා සීමිත නිලධාරීන් වාර්තා කළ බැවින් 2020 වර්ෂය සඳහා වන වාර්ෂික කාර්යසාධන වාර්තා පාර්ලිමේන්තුවේ සභාගත කිරීමේ දිනය 2021.06.30 දින දක්වා දීර්ඝ කරන බව දක්වමින් අංක PFD/RED/REG/02/CC/01/2021 හා 2021.05.12 දිනැති ලිපිය මුදල් අමාත්‍යාංශය මඟින් නිකුත් කර ඇති අතර, 2021 වර්ෂයේ කාර්යසාධන වාර්තා පාර්ලිමේන්තුවේ සභාගත කිරීමේ දිනය 2022.06.30 දින දක්වා දීර්ඝ කරමින් අංක PFD/RED/REG/02/CC/2022 හා 2022.05.26 දිනැති ලිපිය නිකුත් කර ඇත. තවද, 2024 අංක 44 දරන රාජ්‍ය මූල්‍ය කළමනාකරණ පනතේ 47(4) වගන්තියේ විධිවිධාන යටතේ, එම පනතේ 3 වන වගන්තියේ (2) වන උප වගන්තියේ (අ) ඡේදයේ (i) සහ (ii) අනුඡේදවලින් ආවරණය වන සෑම රාජ්‍ය අස්ථිත්වයක්ම, සෑම මුදල් වර්ෂයක්ම අවසන් වීමෙන් දින එකසිය අසූවකට නොඅඩු කාලයකදී අදාළ ලිඛිත නීතීන් සහ ඒ යටතේ සාදන ලද නියෝගවල නිශ්චිතව දක්වා ඇති අවශ්‍යතා සපුරාලීම සඳහා අනෙකුත් ලියවිලි අතර ගිණුම් සහ වෙනත් මූල්‍ය ප්‍රකාශන ඇතුළත් කාර්යසාධන වාර්තාවක්/ වාර්ෂික වාර්තාවක් පළ කළ යුතු බැවින්, එම පසුබිම තුළ කාර්යසාධන වාර්තාව පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීමේ දිනය "මුදල් වර්ෂය අවසන් වී දින 150 ක් ගත වීමට පෙර" යන්න "මුදල් වර්ෂය අවසන් වී දින 180 ක් ගත වීමට පෙර" ලෙස සංශෝධනය කරමින්, 2025.05.30 දිනැති රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක 02/2025 නිකුත් කර ඇත.
03	**විගණන විමසුම් වලට පිළිතුරු ලබා නොදීම.**	මෙම කරුණු මුදල් අමාත්‍යාංශ විෂයපථයට සෘජුවම අදාල නොවන බැවින් ඒ සඳහා වෙනත් නිරීක්ෂණද නොමැත .මෙය අදාල ප්‍ර.ග.නි. / ග.නි. ගේ වගකීමක් වේ.

04.	**වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම සඳහා අනුමැතිය ලබා නොගැනීම, විගණන විමසුම්වලට පිළිතුරු ලබා නොදීම** <u>කාරක සභාවේ නිර්දේශ</u> • අදාළ කාලසීමාවේ සේවයේ නියුතුව සිටි හිටපු දුම්රිය සාමාන්‍යාධිකාරීවරුන්, අමාත්‍යාංශ ලේකම්වරුන් ඇතුළු වගකිව යුතු නිලධාරීන් මීළඟ රැස්වීමට කැඳවා මෙම කරුණට අදාළව හේතු විමසීමට කාරක සභාව තීරණය කළ අතර අවශ්‍ය තොරතුරු ලබා ගෙන එකී නිලධාරීන් කාරක සභාව හමුවට කැඳවන ලෙස කාරක සභාවේ ලේකම් වෙත නිර්දේශ කරන ලදී. • 2025 වර්ෂයට අදාළ ප්‍රසම්පාදන සැලැස්ම සතියක් ඇතුළත (2025.05.16 දින වන විට) මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය වෙත ලැබීමට කටයුතු කරන ලෙස කාරක සභාව ග.නි වෙත නිර්දේශ කරන ලදී. • ප්‍රසම්පාදන ක්‍රියාවලියේ දුර්වලතා හේතුවෙන් දෙපාර්තමේන්තුව විසින් මිලදී ගෙන ඇති මිල අධික යන්ත්‍ර/ යන්ත්‍රාගාර හා උපකරණ ඌන උපයෝජිතව පැවතීම කෙරෙහි අවධානය යොමු කළ කාරක සභාව 2012 වසරේ සිට එම මිලදී ගැනීම්වලදී නිසි ශක්‍යතා අධ්‍යයනයක් සිදු කර නියමිත ප්‍රසම්පාදන ක්‍රියාවලිය අනුගමනය කර ඇති ද යන්න පිළිබඳව වාර්තාවක් කාරක සභාව වෙත ලබා දෙන ලෙස දෙපාර්තමේන්තුවේ ගණන්දීමේ නිලධාරියා වෙත නිර්දේශ කරන ලදී.	සියළුම රජයේ අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු හා දිස්ත්‍රික් ලේකම් කාර්යාල විසින් ඉදිරි වර්ෂයේ පුනරාවර්තන හා ප්‍රාග්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම සඳහා වන වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම පිළියෙළ කිරීමේ අවශ්‍යතාවය හා ඒ සඳහා ප්‍රධාන ගණන්දීමේ නිලධාරියාගේ අනුමැතිය ලබා ගැනීමේ අවශ්‍යතාවය සම්බන්ධයෙන් 2020.08.28 දිනැති රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක 02/2020 හි 04 ඡේදය මඟින් විධිවිධාන සලසා ඇති අතර, ඒ සඳහා භාවිතා කළයුතු ආකෘති පත්‍ර සම්බන්ධයෙන් මාර්ගෝපදේශ අංක 13 නිකුත් කර ඇත. 2025.01.01 දින සිට බලාත්මක වන ජාතික ප්‍රසම්පාදන කොමිෂන් සභාව විසින් අනුමත කරනු ලැබූ භාණ්ඩ, වැඩ සහ උපදේශක නොවන සේවා සඳහා වන ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය - 2024 හි ප්‍රධාන ප්‍රසම්පාදන සැලැස්ම, වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම සහ සවිස්තරාත්මක වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම පිළියෙළ කිරීම සහ අනුමැතිය ලබා ගැනීම සම්බන්ධයෙන් විධිවිධාන ඇතුළත් කර ඇත.

05.	ක්‍රියාකාරී සැලැස්ම කාරක සභාවේ නිර්දේශ • මෙම විගණන කරුණ සඳහා කාරක සභාව විසින් නිර්දේශ ලබා නොදෙන ලදී.	ක්‍රියාකාරී සැලැස්ම පිළියෙළ කිරීම, ඒ සඳහා භාවිතා කළයුතු ආකෘති පත්‍ර හා දත්ත ඇතුළත් කිරීමේ මාර්ගෝපදේශ ඇතුළත් කරමින් 2020.08.28 දිනැති රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක 02/2020 හි 03 ඡේදයෙහි විධිවිධාන සහ ඒ සඳහා වන මාර්ගෝපදේශ අංක 12 නිකුත් කර ඇත.
06	දුම්රිය මාර්ගය අලුතින් ඉදි කිරීම සඳහා ගලවා ඉවත් කළ පැරණි සිල්පර හා රේල්පීලි මහව සිට ඕමන්තේ දක්වා දුම්රිය මාර්ගය දෙපස ප්‍රයෝජනයට නොගෙන විනාශ වීම.	මෙම කරුණු මුදල් අමාත්‍යාංශ විෂයපථයට සෘජුවම අදාල නොවන බැවින් ඒ සඳහා වෙනත් නිරීක්ෂණද නොමැත.
07	මහව සිට අනුරාධපුරය දක්වා වූ කොටසෙහි සංඥා පද්ධතිය.	මෙම කරුණු මුදල් අමාත්‍යාංශ විෂයපථයට සෘජුවම අදාල නොවන බැවින් ඒ සඳහා වෙනත් නිරීක්ෂණද නොමැත.
08	වන අලි දුම්රියේ ගැටීම.	මෙම කරුණු මුදල් අමාත්‍යාංශ විෂයපථයට සෘජුවම අදාල නොවන බැවින් ඒ සඳහා වෙනත් නිරීක්ෂණද නොමැත.
09	දෙපාර්තමේන්තුවේ අයවියයුතු හිඟ ආදායම් අය කර ගැනීම.	මෙම ආදායම් අයකර ගැනීම හා පසු විපරම් කිරීමේ කාර්යය ගණන් දීමේ නිලධාරියාගේ වගකීමක් වන බව පෙන්වා දිය හැක.
10	දුම්රිය දෙපාර්තමේන්තුව සතු ඉඩම්/දේපල ඇතුළත් දත්ත පද්ධතියක් ස්ථාපිත නොකිරීම/ දේපල නිසි පරිදි ලේඛනගත නොකිරීම.	මෙම කරුණු මුදල් අමාත්‍යාංශ විෂයපථයට සෘජුවම අදාල නොවන බැවින් ඒ සඳහා වෙනත් නිරීක්ෂණද නොමැත.
11	හචිසන් ටෙලිකොමියුනිකේෂන් ලංකා පුද්ගලික සමාගම හා දුම්රිය දෙපාර්තමේන්තුව එක්ව දුම්රිය මාර්ගයේ ඒකාබද්ධ ව්‍යාපෘතියක් ක්‍රියාත්මක කිරීම.	මෙම කරුණු මුදල් අමාත්‍යාංශ විෂයපථයට සෘජුවම අදාල නොවන බැවින් ඒ සඳහා වෙනත් නිරීක්ෂණද නොමැත.
12	එන්ජින් සහ බලවේග කට්ටල අවුරුදු 01 සිට අවුරුදු 08 කට ආසන්න කාලයක් රත්මලාන ප්‍රධාන යාන්ත්‍රික ඉන්ජිනේරු කාර්යාල පරිශ්‍රයේ හා දුම්රිය නැවතුම්පළ වල නවතා තිබීම.	කාරක සභා නිර්දේශයක් නොමැත.

13	දුම්රිය තුළ හා දුම්රිය අංගනවල සිදුවන සොරකම්.	මෙම කරුණු මුදල් අමාත්‍යාංශ විෂයපථයට සෘජුවම අදාල නොවන බැවින් ඒ සඳහා වෙනත් නිරීක්ෂණද නොමැත.
14	දුම්රිය සේවාවන් නිරන්තරයෙන් බිඳ වැටීම හා දෙපාර්තමේන්තුවේ අකාර්යක්ෂමතාවය.	මෙම කරුණු මුදල් අමාත්‍යාංශ විෂයපථයට සෘජුවම අදාල නොවන බැවින් ඒ සඳහා වෙනත් නිරීක්ෂණද නොමැත.
15	දෙපාරතමේන්තුවේ කාර්ය මණ්ඩල සංයුතිය.	කාරක සභා නිර්දේශයක් නොමැත.
16	දුම්රිය මාර්ගයේ පවතින ගැටලු	කාරක සභා නිර්දේශයක් නොමැත.
17	පැරණි කැලණිය දුම්රිය පාලම ඉදිකිරීමේ හා ප්‍රතිස්ථාපනය කිරීමේ ව්‍යාපෘතිය.	කාරක සභා නිර්දේශයක් නොමැත.
18	රත්මලාන ප්‍රධාන යාන්ත්‍රික ඉංජිනේරු කාර්ලයාල පරිශ්‍රයෙහි ඌන උපයෝජිත යන්ත්‍ර සූත්‍ර හා අබලි ද්‍රව්‍ය ගොඩගැසී පැවතීම.	කාරක සභා නිර්දේශයක් නොමැත.
19	M – 11 දුම්රිය එන්ජින් මිලදී ගැනීම හා නඩත්තුව.	මෙම කරුණු මුදල් අමාත්‍යාංශ විෂයපථයට සෘජුවම අදාල නොවන බැවින් ඒ සඳහා වෙනත් නිරීක්ෂණද නොමැත.
20	දුම්රිය ආසන වෙන් කර ගැනීම හා සම්බන්ධ මොබිටෙල් ආයතනය සමග පැවති ගිවිසුම.	කාරක සභා නිර්දේශයක් නොමැත.
21	දුමරිය මගින් හුණුගල් ප්‍රවාහනය සඳහා දුම්රිය එන්ජින් හා රියදුරන් ලබා දීම වෙනුවෙන් අයවිය යුතු මුදල් අයකර ගැනීම.	කාරක සභා නිර්දේශයක් නොමැත.
22	ඇණවුම් කරන ලද භාණ්ඩ නිසි ප්‍රමිතියෙන් හා ඉල්ලුම් කරන ලද ප්‍රමාණ වලින් ලැබී තිබේදැයි සහතික කිරීමකින් තොරව සැපයුම් කරුවන්ට මුදල් ගෙවීම හා අඩුවෙන් ලැබී ඇති භාණ්ඩ සඳහා අයකර ගත යුතු මුදල් අය කර නොගැනීම.	කාරක සභා නිර්දේශයක් නොමැත..

23	**දුම්රිය මගින් භාණ්ඩ ප්‍රවාහනය.**	මෙම කරුණු මුදල් අමාත්‍යාංශ විෂයපථයට සෘජුවම අදාල නොවන බැවින් ඒ සඳහා වෙනත් නිරීක්ෂණද නොමැත.
24	**දුම්රිය අනතුරු.**	මෙම කරුණු මුදල් අමාත්‍යාංශ විෂයපථයට සෘජුවම අදාල නොවන බැවින් ඒ සඳහා වෙනත් නිරීක්ෂණද නොමැත.
25	**දුම්රිය දෙපාර්තමේන්තුවේ බඳවාගැනීම් හා උසස් කිරීම්.**	මෙම කරුණු මුදල් අමාත්‍යාංශ විෂයපථයට සෘජුවම අදාල නොවන බැවින් ඒ සඳහා වෙනත් නිරීක්ෂණද නොමැත.
26	**අන්තර්ජාලය හරහා දුම්රිය ආසන වෙන්කර ගැනීම**	කාරක සභා නිර්දේශයක් නොමැත.
27	**හචිසන් ටෙලිකොමියුනිකේෂන් ලංකා පුද්ගලික සමාගම හා දුම්රිය දෙපාර්තමේන්තුව එක්ව දුම්රිය මාර්ගයේ ඒකාබද්ධ ව්‍යාපෘතියක් ක්‍රියාත්මක කිරීම.**	මෙම කරුණු මුදල් අමාත්‍යාංශ විෂයපථයට සෘජුවම අදාල නොවන බැවින් ඒ සඳහා වෙනත් නිරීක්ෂණද නොමැත.
28	**දුම්රි ගමනාගමනය හා දුම්රිය ඇතුළත පහසුකම්.**	මෙම කරුණු මුදල් අමාත්‍යාංශ විෂයපථයට සෘජුවම අදාල නොවන බැවින් ඒ සඳහා වෙනත් නිරීක්ෂණද නොමැත.

පාර්ලිමේන්තු ප්‍රකාශන මාලා අංක 491 සඳහා ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුවට අදාළව ස්ථාවර නියෝග අංක 119(4) යටතේ රාජ්‍ය ගිණුම් කාරක සභාව විසින් ඉදිරිපත් කරනු ලබන වාර්තා සම්බන්ධයෙන් ගරු මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යවරයාගේ නිරීක්ෂණ සහ ගනු ලබන පියවර පිළිබඳ තොරතුරු ඉහත පරිදි කාරුණිකව ඉදිරිපත් කරමි.

ආචාර්ය හර්ෂණ සූරියප්පෙරුම
ලේකම්
මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය.